ඒ නිසා බුදුදහම කර්මය අවධාරණය කරන්නේ අන් සමයන්ට වඩා හාත්පසින්ම වෙනස් ආකාරයටය. බුද්ධකාලීන ඇතැම් ශාෂ්තෘවරුන් කර්ම සංකල්පය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කොට තිබූ අවධියක බුදුන් වහන්සේ හේතු ඵල පදනම මත පුද්ගලයාට කර්මයේ ඇති බලපෑම මැනවින් පෙන්වා දී ඇත. නමුත් කර්මය පෙන්වා දීමෙන් බුදුදහම අවධාරණය කරන්නේ කර්ම රැස් කරමින් කර්මයේ දාසයන් වශයෙන් ජීවත් වීම නොව කර්මක්‍ෂය කිරීමේ ප්‍රතිපදාවට යොමු වන ලෙසයි. නිවන ඇත්තේ එතනය. භවගාමී වූ කර්ම රැස් කරමින් ගමන් කිරීමෙන් සිදුවන්නේ දීර්ඝ වූ සසරෙහි මැරෙමින් ඉපදෙමින් ගමන් කිරීම මිස අන් කිසිවක් නොවේ.

මේ පිළිබඳ වැඩි දුර විස්තර මූණුපොතේ "උසස් පෙළ බුද්ධ ධර්මය" වෙබ් පිටුවට පිවිස ලබාගන්න





# උසස් පෙළ බුද්ධ ධර්මය
## 8. 0 නිපුණතාව
## 8.2 නිපුණතා මට්ටම

# කර්මය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම

කොටදූපේ සුමන හිමි



www.pirivena.lk

## කර්මය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම

බුදුදහමේ ඇති මූලික ඉගැන්වීම් අතර ඇති ප්‍රධානම මාතෘකාවක් ලෙස කර්ම සංකල්පය හැඳින්විය හැක. බුදු දහම කර්ම ලෙස අර්ථ දක්වන්නේ පුස්ගලයා සිත කය වචනය යන තිදොරින් කරන්නාවූ සචේතනික ක්‍රියාවන්ය. කර්මයේ හොඳ නරක තීරණය වන්නේ පුද්ගලයා ඒ සඳහා යොදවන මානසික ක්‍රියාකාරීත්වය මතයි. යමෙක් දූෂිතවූ සිතින් යමක් කරයි නම් කියයි නම් ඒ අනුව දුක් විපාක විඳීමට සිදුවීමත් ප්‍රසන්න වූ සිතින් සිදු කරයි නම් ඒ අනුව සැප විපාක විඳීමත් සිදුවේ.මේ අනුව චේතනාවේ ඇති ගැඹුරු භාවය තේරුම්ගත යුතුය. මිනිසා කර්ම බිහිකරගන්නේ මම සුවපත් කරන්නට යෑම නිසාය.ඉන්ද්‍රියානුසාරීව ගොඩනගා ගන්නාවූ අරමුණු නිසා වේදනා සඤ්ඤාදී මානසික ස්වභාවයන් නිර්මාණය වේ. හොඳ හෝ නරක කර්ම බිහිවන්නේ මේ අරමුණු ගැනීමේ ස්වභාවය උඩයි. ඒය විශේෂයෙන්ම අයත් වන්නේ චේතනා අංශයටයි. අ නි නිබ්බේධික සූත්‍රයට අනුව කර්මයට නිදානය වන්නේ ස්පර්භය බව පෙන්වා දී ඇත. ස්පර්ශය ඇතිවන්නේ ඉන්ද්‍රිය හා අරමුණ එකිනෙකට ගැටීම නිසාය.

(කතමෝ ච භික්ඛවෙ කම්මානං නිදාන සම්භවෝ ? ඵස්සෝ භික්ඛවෙ කම්මානං නිදාන සම්භවෝ) අ නි 4 නිබ්බේධික සු 208

වේදනා සංඥාදීවූ විවිධ කර්ම බිහිවන්නේ මේ ක්‍රමය අනුවය.ප්‍රතිවිපාක වශයෙන් පුද්ගලයා වගකිව යුතු කර්ම බිහිවන්නේ මේ හේතුඵල රටාවට අනුවය.

අ නි නිබ්බේධික සූත්‍ර දේශනාව තුලදී මේ කර්මයේ ඇති විවිධ ස්වරූප පෙන්වා දී ඇත. එය කම්ම වේමත්තතාව වශයෙන් හැඳින්වෙයි. ඒ විවිධත්වය ඇතිවන්නේ එයට මුල්වූ චේතනාවේ ස්වරූපය අනුවය. ඒ අනුව නිරයවේදනීය තිරච්ඡානවේදනීය පෙත්තිවිසයවේදනීය මනුස්ලෝකවේදනීය දිව්‍යලෝකවේදනීය වශයෙන් දක්වා ඇත.





ඒ නිසා සියල්ලම කර්මයෙන්ම සිදුවනවා යයි අතීත මහණ බමුණන් පෙන්වා දුන් ''පුබ්බේකතහේතුවාදය'' මෙමගින් ප්‍රත්ක්ෂේප වේ.

කර්මයේ ස්වභාවය එසේ වුවත් යම් අවස්ථාවන්හිදී කර්මයේ සාමාන්‍ය ස්වභාවයන් වෙනස් වන අවස්ථාද දක්නට ලැබේ.බුදුන් වහන්සේ මහාකම්ම විභංග දේශනාව තුලදී පැහැදිලි කරන්නේ ඇතැම් විට දස අකුසල් කල කෙනා සුගතිගාමී වීමත් දුගතිගාමී වීමත් දස කුසල් කල කෙනා දුගතිගාමී වීමත් සුගතිගාමී වීමත් සිදුවිය හැකි බවයි.

(ඉති ඛෝ ආනන්ද අත්ථි කම්මං අභබ්බං අභබ්බාභාසං අත්ථි කම්මං අභබ්බං භබ්බාභාසං අත්ථි කම්මං භබ්බඤ්චේව භබ්බාසඤ්ච අත්ථි කම්මං භබ්බං අභබ්බාසන්ති). ම නි 3 මහාකම්මවිභංග සූත්‍රය

මේ විසිතුරු භවය නිසාම බුදුන් වහන්සේ දේශනා කරන්නේ කර්ම විෂය සිතිය නොහැකි අචින්ත්‍ය ධර්මයක් ලෙසයි.යමෙක් එය සිතන්නේ නම් හෙතෙම උම්මාදයට පත්වන බවයි.

(කම්ම විසයො භික්ඛවේ අචින්තෙය්‍යා න චින්තේතබ්බෝ යං චින්තෙන්තො උම්මාදස්ස විඝාතස්සභාගී අස්ස)
අ නි 2 අචින්තෙය්‍ය සූත්‍රය 150



www.pirivena.lk

බුදුදහම කර්ම සංකල්පය විග්‍රහ කර්න්නේද හේතු ඵල පදනම මත පිහිටාගෙනය.ප්‍රතීත්‍ය සමුප්පාද ඉගැන්වීම තුල ඇති සංඛාර යන්න කර්ම බිහිවීම සඳහා බලපාන ප්‍රධාන සාධකය ලෙස දක්වයි. **සංඛාර පච්චයා විඤ්ඤාණං** යනුවෙන් සඳහන් කරන්නේ එයයි.මෙහි සංඛාර ගණයට ධර්මය තුල කතා කරන්නේ රූප සඤ්චේතනා සද්ද සඤ්චේතනා ආදී වශයෙන් ඉන්ද්‍රිය සය අනුව ගන්නාවූ අරමුණු ඔස්සේ ගොඩ නගා ගන්නාවූ නාම ධර්ම සමූහයයි.

**(කතමේච භික්ඛවේ සංඛාරා ඡයිමේ භික්ඛවේ චේතනා කායා රූප සඤ්චේතනා ධම්ම සඤ්චේතනා) ස නි 3 උපාදානපරිවත්ත සූ 106**

මේ අයුරින් ගොඩනගා ගන්නාවූ කර්ම නිසා ඉලෝකය හා ප්‍රජාව නොසිඳී පවතින බව මෙන්ම ලෝකයේ වෙසෙන සියල්ලෝම කර්මය නම් එකම් ධර්මයේ වසගයේ ජීවත්වන බව පෙන්වා දෙයි.

**කම්මනා වත්තතී ලෝකෝ කම්මනා වත්තති පජා**
**කම්ම නිබන්ධනා සත්තා රථස්සානිව යායතෝ**
**සූ නි වාසෙට්ඨ සූ 200**

කුසලා කුසල කර්ම අනුව විපාක ලැබෙන බව බුදු දහම පිළිගත්තත් සියල්ලම කර්මයෙන් සිදු නොවන බව පෙන්වා දෙයි. ලෝකයේ ඇති සන්සිද්ධිවල සිදුවන ක්‍රියාකාරීත්වය ‘‘නියාම ධර්ම’’ මගින් පෙන්වා දෙන බුදු දහම එහි එක් කොටසක් ලෙස පමණක් කර්මය පෙන්වා දී ඇත. **(කම්ම නියාම)** එසේම ගිරිමානන්ද සූත්‍රය තුල මිනිසාට වැළඳෙන විවිධ රෝගයන් දක්වන තැන ද කර්මයෙන් වන රෝග එක් අවස්ථාවක් ලෙස පමණක් දක්වා ඇත.( **කම්මවිපාකජා ආබාධා**)





**(කතමං භික්ඛවේ කම්මානං නිදාන සම්භවෝ අතථි භික්ඛවේ කම්මං නිරය වේදනීයං තිරච්ඡානවේදනීයං පෙත්තිවිසය වේදනීයං මනුස්සලොකවේදනීයං දෙවලෝකවේදනීයං) අ නි 4 නිබ්බේධික සූ 208**

බුදුදහම කර්මය පුද්ගලයා කෙරෙහි බලපාන ආකාරය විවිධ වශයෙන් දක්වා ඇත.එනම් කෘත්‍ය වශයෙන් විපාක දෙන පිලිවෙළ වශයෙන් හා විපාකදෙන කාල වශයෙන් හා විපාක දෙන ස්ථාන වශයෙනි. කෘත්‍ය වශයෙන් සතරාකාරව දක්වා ඇත.එනම්

01 ජනක
02 උපත්ථම්භක
03 උපපීඩක
04 උපඝාතක

වශයෙනි.යම් භවයක උප්පත්තිය සඳහා බලපාන්නේ ජනක කර්මයයි.ඒ ලබාගත් උප්පත්තිය පවත්වාගෙන යෑම සඳහා බලපාන්නේ උපත්ථම්භක කර්මයයි.ලබාගත් සුවදායක තත්වය හෝ දුක්ඛදායක තත්වයට බාධා කිරීම උපපීඩක කර්මයෙන් සිදුවේ. ඒ සියලුම ශක්තීන් දුර්වලකොට විනාශකොට දැමීම උපඝාතක කර්මයෙන් සිදු කරයි.

විපාක දෙන පිළිවෙල වශයෙන් කර්මය සතරාකාර වෙයි.එනම්

01 ගරුක
02 ආචිණ්ණ
03 ආසන්න හා
04 කටත්තා

වශයෙනි.ගරුක කර්ම නම් ඉතා බරපතලම කර්මයි.අකුසලය පැත්තෙන් ආනන්තරිය කර්මත් කුසල අංශයෙන් නොපිරිහුණු සමාධියත් ගරුක කර්ම ලෙස අරුත් දැක්විය හැක.ප්‍රබල වූ ගරුක කර්මයක් නෙවේ නම් මරණාසන්න මොහොතේ සිදුකල කර්මය අනුව ප්‍රතිසන්ධිය



www.pirivena.lk

සිදුවේ නම් එය ආසන්න කර්ම නම් වේ.ජීවිතයේ නතර හුරු පුරුදු වශයෙන් සිදුකළ දාන ශීල භාවනාදී කර්ම අචිණ්ණ කර්ම නම් වේ.බලවත් වූ චේතනා ශක්තියක් නොමැති ප්‍රතිසන්ධි ලබාදීමට තරම් හැකියාවක් නැති කර්ම කටත්තා කර්ම නම් වේ.

විපාක දෙන කාල වශයෙන්ද කර්මය සිව්වැදෑරුම් වේ.එනම්

01 දිට්ඨධම්මවේදනීය
02 උපපජ්ජ වේදනීය
03 අපරාපරිය වේදනීය
04 අහෝසි කර්ම

වශයෙනි. කලාවූ කුසලාකුසල කර්මයන් සඳහා ඒ ආත්මභාවයේදී සැප හෝ දුක් විපාක විඳින්නට සිදුවේ නම් ඒවා දිට්ඨධම්ම කර්ම නම් වේ. මේ භවයේ විපාක නොදී ඊළඟ භවයේදී විපාක විඳින්නට සිදුවන කර්ම උපපජ්ජවේදනීය නම් වේ. දෙවනි භවයේත් විපාක නොදෙන කර්ම සසරෙහි සැරිසරන කාලයේ කෙබඳු දිනකදී විපාක දෙයි.ඒවා අපරාපරිය වේදනීය නම් වේ. අරහත් පල සමාධියෙන් සසර ගමන අවසන් වූ පසු විපාක දෙන්නට ඉඩක් නොලද කර්ම අහෝසි ගනයට වැටේ. මේ ආදී වශයෙන් කර්මය පුද්ගලයාට බලපාන අන්දම බුදුදහම පෙන්වා දී ඇත.

එසේම විපාක පෙන ස්ථාන වශයෙන්ද කර්මය සිව් වැදෑරුම්ව දක්වා ඇත. එනම්

01 අකුසල
02 කාමාවචර
03 රූපාවචර
04 අරූපාවචර වශයෙනි.

සත්වයා මේ ලෝක වශයෙන් විවිධත්වයන්ට පත්වන්නේ කර්මයේ ඇති ස්වභාවය අනුවයි. තෝදෙය්‍ය පුත්ත සුභ මනවකයා දිනක් බුදුන් වහන්සේගෙන් මේ ලෝකයේ මිනිසුන්ගේ





විවිධත්වයක් ඇති වී තිවෙන්නේ කුමක් හෙයිනද යන්න ඇසූ පැනයකදී උන්වහන්සේ පවසා සිටියේ මේ ලෝකයේ පුද්ගලයා උසස් පහත් බවට පත් කරන්නේ ඔහුගේ කර්මවේගය බව පෙන්වා දුන්නේය.

**(කම්මස්සකතා මානවසත්තා කම්මදායාදෝ කම්මයෝනි කම්මබන්ධූ කම්මපටිසරණා කම්මං සත්තේ විභජති යදිදං හීනප්පණීතතාය) මනි 3 චූලකම්මවිභංග සු 432**

මේ සංවාදය තුළදී බුදුන් වහන්සේ කර්මයේ ඇති විවිධ ස්වරූප අනුව සත්වයාගේ උස් පහත් ස්වභාවය පෙන්වා දුන්නේය.

| කර්මය | විපාකය | මිනිස් ආත්මයේ ස්වභාවය |
|---|---|---|
| පාණාතිපාතී හොති | දුග්ගති | අප්පායුකො හොති |
| පාණාතිපාතා පටිවිරතො | සුගති | දීඝායුකො |
| විහේඨක ජාතිකො හොති | දුග්ගති | බව්හාබාධෝ |
| අවිහේඨක ජාතිකො හොති | සුගති | අප්පාබාධෝ |
| කෝධනෝ හෝති | දුග්ගති | දුබ්බණ්ණෝ |
| අක්කෝධනො හෝති | සුගති | සුවණ්ණෝ පාසාදිකො |
| ඉස්සාමනකෝ හොති | දුග්ගති | අප්පේසක්ඛෝ |
| අනිස්සාමනකෝ හොති | සුගති | මහෙසක්ඛසංවත්තනිකො |
| න දාතා හොති | දුග්ගති | අප්පභෝගො |
| දාතා හොති | සුගති | මහාභෝගසංවත්තනිකා |
| ථද්ධෝ හොති අතිමානී | දුග්ගති | නීචකුලිනො |
| අථද්ධෝ හොති අනතිමානී | සුගති | උච්චකුලීනො |
| න පරිපුච්ඡිතා හොති | දුග්ගති | දුප්පඤ්ඤෙදා |
| පරිපුච්ඡිතා හොති | සුගති | මහාපඤ්ඤදා |



www.pirivena.lk